අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref.: PTF/01/Circular/01

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.:

දිනය / திகதி / Date: 2020.11.02

චක්‍රලේඛ අංකය: PTF/ 03/2020(VI)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ**
**ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්වය නිසා පීඩාවට පත්වූ පවුල් වලට සහ නිරෝධායනයට යොමුකළ පවුල් වලට සහන සැලසීම</u>**

COVID-19 වසංගත තත්වය හේතුවෙන් සතියකට වඩා වැඩි කාලයක් ඇදිරිනීතිය පනවා ඇති ප්‍රදේශවල ජනතාවගේ දෛනික ජීවනෝපායන් අහිමි වීම නිසා තම මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා එක් පවුල් ඒකකයකට මසකට රුපියල් 5,000ක දීමනාවක් ලබා දීමට රජය විසින් තීරණය කර ඇත.

2. මේ සඳහා ප්‍රතිලාභින් තෝරා ගැනීම මීට පෙර නිකුත් කර ඇති PTF/03/2020 අංක දරන චක්‍රලේඛය අනුව සිදුකළ යුතු අතර, පසුගිය COVID-19 වසංගතය තත්වය හමුවේ රුපියල් 5,000 දීමනාව ගෙවීමට තොරා ගත් දෙවැනි වටයේ ප්‍රතිලාභීන් මේ සඳහා සුදුසුකම් ලබයි. මීට අමතරව, මෙම අවස්ථාවේදී ආදායම් අහිමි, මෙම දීමනාව ලැබීමට සුදුසු පවුල් ඒකක වේ නම්, ග්‍රාමීය කමිටුවේ නිර්දේශය මත ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් පසු තෝරාගත් පවුල් ඒකක සඳහා ද අදාළ ප්‍රතිලාභ ලබා දිය හැකිය.

3. තවද, සෞඛ්‍ය අංශ වල සෘජු උපදෙස් මත තම නිවෙස් තුළම නිරෝධායනය (Home quarantine) වන පවුල් වලට අවශ්‍ය රුපියල් 10,000ක් වටිනා ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මල්ලක් ලබා දීමට ද රජය තීරණය කර ඇත. එය එක්වර හෝ රුපියල් 5,000ක් වටිනා බඩු මලු 2ක් ලෙසට ද ලබා දිය හැකිය.

4. එලෙසම, සෞඛ්‍ය අංශ විසින් හුදකලා ගම්මාන (Lockdown) ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ වල ආදායම් අහිමි පවුල් ඒකක වලටද රුපියල් 10,000ක් වටිනා ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මල්ලක් ලබා දිය හැකිය. කෙසේ වෙතත්, කිසියම් පවුල් ඒකකයකට රුපියල් 10,000ක් වටිනා ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මල්ල සහ රුපියල් 5,000 දීමනාව යන දෙකම ලබා ගැනීමට හිමිකම් නොමැත.

5. දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මෙම කටයුතු මෙහෙයවන අතර, අවශ්‍ය නම් ඒ සඳහා ආරක්ෂක අංශවල සහය ද ලබා ගත හැකි ය.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
4. ලේකම්, අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
5. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
6. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්
7. යුද හමුදාපති
8. පොලිස්පති